6 මට හැඟෙන අයුරින් රසිකොලොජිය
rasikalogy.blogspot.com

# බොටල් ජානිස් ලා!

මවිසින් ලියන ලදුව, සන්නස සඟරාවේ මෙතෙක් පළ වී ඇති "පමා නොවී එමි අකුරට", "කොලු කාලේ", "අපේ කාලේ කතන්දර" මෙන්ම මේ "රසිකොලොජිය" වැනි සටහන් කෙසේ වුව ද, දිනපතා, සතිපතා පුවත්පත්වල, වාර සඟරාවල පළවෙන කොලම් හෙවත් තීරු ලිපි යනු ඉතා ජනප්‍රිය සාහිත්‍යමය විශේෂාංගයකි.

අප තරුණ කාලයේ දිවයින ඉරිදා පුවත්පතේ පළ වූ "ආරච්චිල", "උකුස්සා" වැනි විශේෂාංග මෙන්ම, ඉරිදා ලක්බිම පුවත්පතේ අද ද පළවෙන "මානිගේ තීරුව" වැනි තීරු ලිපි ද මෙහි දී ඔබේ සිහියට නැගෙනු ඇත.

මේ සමහර තීරු ලිපි වැදගත් ගවේෂණාත්මක කරුණු මෙන්ම දේශපාලන විෂයයන් ගැන ලියවුණු ඒවා වූ අතර, උපහාසය කැටිකොට ගෙන ලියවුණු තීරු ලිපි ද එසේම වැදගත් තීරු ලිපි ද විය. මෙහි දී මගේ සිහියට නැගෙන්නේ අනූවේ දශකයේ මුල්භාගයේ මා ඉතා උනන්දුවෙන් කියවූ "පිස්සාගේ පලාමල්ල" නම් තීරු ලිපියයි. පිස්සා නම් අන්වර්ථ නමකින් යුතුව ලියවුණු මේ තීරු ලිපිය සතිපතා පළ වූයේ, ඉරිදා ලංකාදීපයේ ය.

අනූවේ දශකයේ මුල්භාගය වන විට, රජයේ පාලනය යටතේ පවතින විද්‍යුත් මාධ්‍යවලට අමතරව පෞද්ගලික සමාගම්වල හිමිකාරීත්වය සහිතව ගුවන් විදුලි සේවා මෙන් ම රූපවාහිනී නාලිකා ද ආරම්භ වී තිබුණි. එසේම, 1993 මැයි මාසයේ දී එතෙක් රටේ පැවති දේශපාලනික හීම සමය හදිසියේ නිමවීමත් සමගම, ඒ ආකාරයේ පුද්ගලික මාධ්‍ය ජාලාවලට පෙර නොවූ ආකාරයේ දේශපාලන නිදහසක් ද ලැබී තිබුණි.

එයින් වැඩි වාසියක් අත්වුණේ සාමාන්‍යයෙන් රාජ්‍ය මාධ්‍යවලින් කිසිසේත් ම ධනාත්මක ප්‍රචාරයක් නොලැබෙන විපක්ෂ කණ්ඩායම්වලට බව අමුතුවෙන් කිව යුතු නොවේ. මේ වෙන නගරබද ප්‍රදේශල තරමක ජනප්‍රියත්වයක් අත් කරගෙන සිටි පෞද්ගලික රූපවාහිනී නාලිකාවක් වූ ටෙලිෂාන් හෙවත් ටී.එන්.එල් ජාලයේ ජනහඬ නම් දේශපාලන වැඩසටහනක් ඇරඹුණේ මේ කාලයේ දී ය.

සතියේ දිනයක සන්ධ්‍යා භාගයේ පැයක පමණ කාලයක් තිස්සේ ප්‍රචාරය කෙරුණු මේ ජනහඬ වැඩසටහනේ ආකෘතිය වූයේ ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ දේශපාලුවන් දෙදෙනෙකු අතර, ටෙලිවිෂන් නාලිකාවේ මාධ්‍යවේදියෙකුගේ මධ්‍යස්ථ මෙහෙයවීම යටතේ පැවැත්වෙන වාදයකි.

ජනහඬ වැඩසටහනේ ප්‍රධාන මෙහෙයවන්නා වූයේ එකල ලංකාදීප පුවත්පත් සමාගමේ මාධ්‍යවේදියෙකු ලෙස කටයුතු කළ ආරියනන්ද දොඹගහවත්ත ය. ඔහුගේ ස්ථානය ඇතැම් සතිවල පිරවූයේ අද ජ්‍යෂ්ඨ රූපවාහිනී වැඩටහන් මෙහෙයවන්නෙකු ලෙස කටයුතු කරන චන්දන සූරියබණ්ඩාර නම් එකල තරුණ මාධ්‍යවේදියා ය. මෙම වැඩසටහන අරඹා සතියකින් දෙකකින් පමණ මේ විවාදය සඳහා ආරාධනා ලැබ තිබුණේ ආණ්ඩු පක්ෂය වෙනුවෙන් එවකට ශ්‍රී ලංකා මහජන පක්ෂයේ නායකයා ලෙස කටයුතු කළ ඔසී අබේගුණසේකර සහ විපක්ෂය වෙනුවෙන් එවකට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජනප්‍රිය මන්ත්‍රීයෙකු වූ මහින්ද රාජපක්ෂ යන දේශපාලුවන් දෙදෙනා ය.

මෙහි දී යම් පැහැදිලි කිරීමක් කළ යුතුව ඇත.

ඔසී අබේගුණසේකර නායකත්වය දැරූ මහජන පක්ෂය වනාහී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් 1984 දී පමණ කැඩී ගිය කණ්ඩායමකි. මේ කණ්ඩායමේ මුල් කාලයේ නායකත්වය දැරුවේ ටීබී ඉලංගරත්න, විජය කුමාරතුංග, චන්ද්‍රිකා බණ්ඩාරනායක වැනි හිටපු සිරිලංකාකාරයින් වූ නමුත් ඔවුන්ගේ අභාවයෙන් සහ විදෙස්ගතවීමෙන් පසු නායකත්වය ඔසී අබේගුණසේකර අතට පත් වී තිබුණි.

ඔසී අබේගුණසේකර පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු නොවී ය. ඔහු එවකට බස්නාහිර පළාත් සභාවේ විපක්ෂ නායකයා විය. එහි ආණ්ඩුබලය තිබුණේ එක්සත් ජාතික පක්ෂයට වූ නමුත් එජාපයේ නායක ර. ප්‍රේමදාස සමග ඇතිකරගෙන තිබුණු විශේෂ සම්මුතියක් නිසා ඔසී අබේගුණසේකර කටයුතු කළේ ආණ්ඩු පක්ෂයේ දේශපාලුවෙකු ලෙසිනි. ඇත්තටම එවකට ජනාධිපති වූ ර. ප්‍රේමදාස විසින් ඔසී අබේගුණසේකර හඳුන්වනු ලැබුවේ ද විපක්ෂ නායකයෙකු ලෙස නොව ප්‍රතිපක්ෂ නායකයෙකු ලෙස ය.

කෙසේ වෙතත්, මේ කියන දිනයේ ටී.එන්.එල් රූපවාහිනී නාලිකාව හරහා අපට දක්නට ලැබුණු ආරියනන්ද දොඹගහවත්ත මෙහෙය වූ ජනහඬ දේශපාලන වාද වැඩ සටහන ඉතා විනෝදාත්මක එකක් විය. එයට මූලික හේතුව වූයේ එම වැඩසටහනට සහභාගී වූ ඔසී අබේගුණසේකර සහ මහින්ද රාජපක්ෂ නම් දේශපාලුවන් දෙදෙනා පොර කුකුළන් දෙදෙනෙකු මෙන් මහ හඬ නංවමින් එකිනෙකා හා වාචිකව පොර කා ගැනීමයි. මේ පොර කෑම වළක්වා විවාදය නිසි පරිදි මෙහෙයවනු වෙනුවට ආරියනන්ද දොඹගහවත්ත අසරණව බලා සිටිනු දක්නට ලැබුණි.

ඒ සති අන්තයේ ලංකාදීපයේ "පිස්සාගේ පලාමල්ල" තීරු ලිපිය ලියවී තිබුණේ මේ ජනහඬ විවාදය පිළිබඳව ය. අදත් මගේ මතකයේ එදා මෙන් ම හොඳින් රැඳී ඇති පරිදි පිස්සා විසින් ජනහඬ වාදයේ නිරත වූ දේශපාලුවන් දෙදෙනාව හඳුන්වා දී තිබුණේ මා මෙන් පොර කුකුළන් දෙදෙනෙකු ලෙස නොවේ. පිස්සු බල්ලන් දෙදෙනෙකු ලෙස ද නොවේ. කබරගොයින් දෙදෙනෙකු ලෙස ය. හබරල ගාලක පොරකන කබරගොයින් දෙදෙනෙකු ලෙස ය.

පිස්සා විසින් ඒ වැඩසටහන මෙහෙයවූ ආරියනන්ද දොඹගහවත්ත හඳුන්වා දී තිබුණේ බෝතල් පත්තරකාරයා යන අරුත දෙන බොටිල් ජානිස් යන විකට නමිනි.

එදා පටන් මා ද, තම කාර්යභාරය නිවැරදිව නොදන්නා මාධ්‍යවේදීන්ව හැඳින්වීමට බොටිල් ජානිස් යන පදය යොදා ගත්තෙමි. පසුකලෙක ඒ යෙදුම මා භාවිතා කළේ ආරියනන්ද දොඹගහවත්ත වැනි මාධ්‍යවේදීන්ට නොව, තම මාධ්‍ය වෘත්තිය ගණිකා වෘත්තියේ යොදවමින්, තම වහල්හිමි ස්වාමි පරපුරේ අභිමතය පරිදි මහජනයා රැවටීමට කටයුතු කරන ජඩ මාධ්‍යවේදීන් හැඳින්වීමට ය.

මේ ආකාරයේ ජඩ මාධ්‍යවේදීන් අද ලංකාවේ කිහිප දෙනෙකු හෝ සිටින බව පසුගිය කාලය තිස්සේ අන්තර්ජාලය හරහා පුවත්පත් කියවන, ඇතැම් රූපවාහිනී වැඩටහන් නරඹන අපි හොඳින් දනිමු.

මේ ජඩමාධ්‍යවේදීහු, තම වහල් හිමි ස්වාමීන් පිනවීමට නොකරන දෙයක් නොමැත. තම සගයන් පාවා දීමට ද නොපැකිළෙති. අතුරුදහන් කරන ලද මාධ්‍යවේදීන් පිළිබඳව උපහාසාත්මක ලිපි ලියති. බොරුව අල්ලේ පැල කර පෙන්වති. කොහේ හෝ තැනක ඉංග්ලිෂ් භාෂාවෙන් පළ වෙන ප්‍රවෘත්තියක කොනක් අල්ලා ගෙන ජෝන් ඩෝ ලා ගැන ද, හඳේ බ්ලොග් ගඩොල් පෝරණු ගැන ද ලියති.

මෙවැනි ජඩමාධ්‍යවේදීන් හෙවත් "බොටිල් ජානිස්ලා" ඉන්නා පැත්ත පළාතක හෝ අප සිටිය යුතු නැති බව මගේ අදහසයි. "බොටිල් ජානිස්ලා" පිළිබඳ මගේ රසිකොලොජි සටහන මෙයින් නිම වේ. ආයුබෝවන්!

රසික සූරියආරච්චි




